ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# බිම්පුත් ෆිනෑන්ස් පී.එල්.සී හි තැන්පත්කරුවන් වෙත කෙරෙන නිවේදනයයි

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා බිම්පුත් ෆිනෑන්ස් පී.එල්.සී වෙත නිකුත් කරනු ලැබ බලපත්‍රය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 37 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2023.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන ලදී. ඒ අනුව 2021 අංක 02 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි වල ප්‍රතිපාදනයන්ට අනුකූලව බිම්පුත් ෆිනෑන්ස් පී.එල්.සී හි රක්ෂණය කරන ලද තැන්පතු සඳහා රක්ෂණ වන්දි ගෙවීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කටයුතු යොදා ඇත.

රක්ෂණ වන්දි ලබා ගැනීම සඳහා නියමිත පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෑමේ අයදුම්පත් ඊට අදාල අනෙකුත් අවශ්‍ය ලේඛන ද සමග ඉදිරිපත් කරන මෙන් බිම්පුත් ෆිනෑන්ස් පී.එල්.සී හි තැන්පත් කරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. හවුල් ගිණුම් හිමියන් වන්දි සඳහා අයදුම් කිරීමේ දී වෙන් වෙන්ව ආකෘති පත්‍ර ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හරහා ගිණුම් හිමියන්ගේ බැංකු ගිණුම් වලට සෘජුවම ම වන්දි මුදල් බැර කිරීම සිදු කෙරෙනු ඇත. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි වලට අනුකූලව රක්ෂිත තැන්පත්කරුවන් 2023.09.01 දින සිට වසර දෙකක් (02) ගත වීමට පෙර හෝ නිසි අධිකරණයක් මගින් බිම්පුත් ෆිනෑන්ස් පී.එල්.සී ආයතනය ඈවර කිරීමට පෙර හෝ යන අවස්ථා දෙකෙන් ප්‍රථමයෙන් උදාවෙන අවස්ථාවට පෙර නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

උක්ත කරුණට සම්බන්ධ වූ අදාළ අයදුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයෙන්, අනුරාධපුර, කිලිනොච්චි, ත්‍රිකුණාමලය, නුවරඑළිය, මාතර සහ මාතලේ යන ප්‍රාදේශීය කාර්යාල වලින් මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය වන www.cbsl.gov.lk, වෙතින් ද ලබා ගත හැකි ය. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෑමේ අයදුම්පත් අනෙකුත් අවශ්‍ය ලේඛන ද සමග හැකි ඉක්මනින් පහත සඳහන් ලිපිනයට, ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුලස්ථාන ගොඩනැගිල්ලේ තැපැල් අංශය වෙත පැමිණ භාර දීම හෝ කළ යුතු වේ. හිමිකම් පෑමේ අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි "BFP" ලෙස සඳහන් කළ යුතු ය.

මේ සම්බන්ධ වැඩි දුර තොරතුරු පහත දැක්වෙන දුරකථන අංකයන්ට ඇමතීමෙන් ලබා ගත හැකි ය.


අධ්‍යක්ෂ
නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01


**වැඩිදුර විමසීම් සඳහා:**
**0112 477261**
**0112 477276**

---

නිළ හැඳුනුම් අංකය:
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

**බිම්පුත් ෆිනෑන්ස් පී.එල්.සී**
**හිමිකම් අයදුම්පත සහ ප්‍රකාශය**
**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය**

සෑම තැන්පත්කරුවෙක් ම හිමිකම් අයදුම්පතෙහි හවුල් ගිණුම් ද ඇතුළු ව තමා සතු සියලුම ගිණුම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු ය. එමෙන් ම සෑම තැන්පත්කරුවෙක් ම (හවුල් තැන්පතු හිමියන් ද ඇතුළත්ව) වෙන වෙන ම හිමිකම් අයදුම්පත බැගින් ඉදිරිපත් කළ යුතු වේ. මෙම අයදුම්පත සම්පූර්ණ කිරීමේදී මෙහි අවසානයට දක්වා ඇති උපදෙස් පිළිපදින්න. **(සියලු හිස්තැන් පිරවීම අනිවාර්ය වේ.)**

1. තැන්පත්කරුගේ තොරතුරු:

1.1. සම්පූර්ණ නම:..........

1.2. හැඳුනුම්පත් අංක : (කරුණාකර උපදෙස් අංක 1, 2 සහ 3 බලන්න.) (හඳුනා ගැනීමේ ලේඛන වල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)

(i) ජාතික හැඳුනුම්පත් අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය :..........(ii) විදේශ ගමන් බලපත්‍ර අංකය:..........(iii) රියදුරු බලපත්‍ර අංකය:..........

1.3. වර්තමාන ලිපිනය : ..........

1.4. දුරකථනය: (ස්ථාවර දුරකථනය)..........(ජංගම දුරකථනය) ..........1.5. විද්‍යුත් තැපෑල..........

2. රක්ෂණ වන්දි මුදල් බැර කිරීම සඳහා තැන්පත්කරුගේ බැංකු ගිණුම් තොරතුරු: (කරුණාකර උපදෙස් අංක 4 බලන්න.)

2.1. ගිණුම් හිමියාගේ නම : .......... 2.2. බැංකුවේ නම : .......... 2.3 ගිණුම් අංකය : ..........

(2.3 හි සඳහන් කළ ගිණුමට අදාළ බැංකු පොතෙහි පළමු පිටුවේ හෝ ගිණුම් ප්‍රකාශනයේ පිටපතක් ඇමිණිය යුතුය.)

2.4. ගිණුම පවත්නා බැංකු ශාඛාව : ..........

3. බිම්පුත් ෆිනෑන්ස් පී.එල්,සී ආයතනයේ 2023.09.01 දිනට තැන්පතු පිළිබඳ තොරතුරු: (එක් එක් තැන්පතුවලට අදාළ තොරතුරු වෙන වෙන ම සැපයිය යුතු ය. අමතර තොරතුරු සඳහන් කිරීමට ඇත්නම් ඒ සඳහා වෙන ම පත්‍රිකාවක් භාවිතා කරන්න. කරුණාකර උපදෙස් අංක 5 සහ 6 බලන්න.)

| ගිණුම් අංකය / තැන්පතු සහතික අංකය / ඉතුරුම් ගිණුම් අංකය | කාණ්ඩ අංකය | තැන්පතු වර්ගය ඉතුරුම්/ස්ථාවර (තනි පුද්ගල/හවුල්) | තැන්පතු වටිනාකම (රුපියල්) |
|---|---|---|---|
| | | | |
| | | | |

**(සියලුම තැන්පතු සහතික, ඉතුරුම් පාස් පොත් සහ අලුත් කිරීමේ ලේඛන වල මුල් පිටපත් මේ සමඟ ඇමිණිය යුතු ය.)**

4. ප්‍රකාශය: (කරුණාකර උපදෙස් අංක 7 බලන්න.)

(ලිපිනය)..........හි පදිංචි (තැන්පත්කරුගේ හෝ නීත්‍යානුකූල හිමිකම්පාන්නාගේ නම) ..........වන මම (තැන්පත්කරුගේ නම) .......... වෙනුවෙන් මෙම හිමිකම් අයදුම්පත ඉදිරිපත් කරන බවත්, ඉහත කී ආයතනයේ තැන්පතුවෙන් කිසිදු කොටසක් ලබා නොගත් බවත්, ඉහත තැන්පතු මුදල හෝ ඉන් කොටසක් පිටසන් කිරීමක් හෝ පැවරීමක් නොකළ බවත් මෙයින් ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ කරන ගෙවීමකට අදාළව මගේ තැන්පතු සම්බන්ධයෙන් වගකීමක්, පොලී මුදලක්, අලාභයක්, පිරිවැයක්, ගෙවීමක් වැනි ඕනෑම සහ සියලු හිමිකම්වලට එරෙහිව තුන්වන පාර්ශ්වයක් විසින් කරන යම් ඉල්ලීමක් හෝ හිමිකම්පෑමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය, ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය සහ එහි කිසිදු සේවා නියුක්තිකයෙකු, නිලධාරියෙකු, එහි නියෝජිතයෙකු, ඒජන්තවරයෙකු කිසිදු වගකීමකට නොබැඳෙන බවට ද තැන්පත්කරු සහ හිමිකම්ලාභියා වන මම මෙහි ලා එකඟ වෙමි.

**අත්සන:**..........
ඉහත ප්‍රකාශය කියවා දීමෙන් අනතුරුව, හිමිකම්ලාභියා විසින් වටහා ගත් බව ප්‍රකාශ කර, 20..........මස..........දින ..........හිදී මා ඉදිරියේදී අත්සන් තබන ලදී.

**අත්සන:**..........
(දිවුරුම් කොමසාරිස්/සාම විනිසුරු)

නිල මුද්‍රාව:.......... ලිපිනය:.......... දිනය:..........

---

**හිමිකම් අයදුම්පත සම්පූර්ණ කිරීමට පොදු උපදෙස්**

මෙම අයදුම්පත අදාල වනුයේ බිම්පුත් ෆිනෑන්ස් පී.එල්,සී හි 2023.09.01 දින බලපත්‍රය අවලංගු කිරීමට පෙර තැන්පතු මුදල් ආපසු ලබා නොගත් තැන්පත්කරුවන් සඳහා පමණි.

1. හැඳුනුම්පත් පිළිබඳ තොරතුරු සඳහන් කිරීමේදී පහත සදහන් උපදෙස් අදාළ වේ:
   - අ.) තනි පුද්ගල ගිණුම් සම්බන්ධයෙන් ජාතික හැඳුනුම්පත (ජා.හැ.)/විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය;
   - ආ.) ළමා ගිණුම් සම්බන්ධයෙන් භාරකරුගේ, ජා.හැ./විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය සහ ළමයාගේ උප්පැන්න සහතිකය;
   - ඇ.) තනි පුද්ගල ව්‍යාපාර, ලියාපදිංචි නොකළ සමිති, සමාජ, හවුල් ව්‍යාපාර හෝ වෙනත් ලියාපදිංචි නොකල ඒකක සම්බන්ධයෙන් බලයලත් නිලධාරීන්ගේ/ හවුල්කරුවන්ගේ, ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර/ රියදුරු බලපත්‍ර;
   - ඈ.) සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ සමාගම් සම්බන්ධයෙන් ලියාපදිංචි අංකය, පත්‍රිකා අංක 20 (අධ්‍යක්ෂවරුන් හෝ ලේකම්වරුන්ගේ විස්තර වෙනස් වීමේදී අදාල වන) සහ සමාගමේ වෙනස්වීම් සම්බන්ධයෙන් අදාළ වන වෙනත් ලියවිලි;
   - ඉ.) ප්‍රාදේශීය/පළාත් පාලන ආයතන යටතේ ලියාපදිංචි ආයතන සම්බන්ධයෙන් අදාල ප්‍රාදේශීය/පළාත් පාලන ආයතන මගින් නිකුත් කළ ලියාපදිංචි අංකය සැපයිය යුතුය.
2. බිම්පුත් ෆිනෑන්ස් පී.එල්,සී හි ගිණුම්/ තැන්පතු ආරම්භ කිරීමේ දී භාවිතා කළ අදාළ හැඳුනුම්පත්වල සහතික කළ ඡායා පිටපත්. (අදාළ හැඳුනුම්පත් පිටපත් නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ සාම විනිසුරුවරයෙකු විසින් සහතික කළ යුතු ය.)
3. තැන්පත්කරුගේ නම සහ හැඳුනුම්පත් අංකය, බිම්පුත් ෆිනෑන්ස් පී.එල්,සී සමාගමේ තැන්පතු සහතික/පාස් පොත්වල සඳහන් නම සහ ගිණුම් ඇරඹීම සඳහා භාවිතා කළ හැඳුනුම්පත් (ජා.හැ., විදේශ ගමන් බලපත්‍ර හෝ රියදුරු බලපත්) අංකය සමග නොසැසඳේ නම් අදාළ වෙනස්කම පැහැදිලි කරමින් සහ නියම තැන්පත්කරු තමා වන බවට සහතික කරමින් දිවිරුම් කොමසාරිස්වරයෙකු හෝ සාම විනිසුරුවරයෙකු ඉදිරියේ අත්සන් තබන ලද නිසියාකාරයේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.
4. තැන්පත්කරුවන්ගේ බැංකු ගිණුම් තොරතුරු තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතු ය.
   - ඉතුරුම් ගිණුමක් නම් - ගිණුම් හිමියාගේ තොරතුරු ඇතුළත් ඉතුරුම් පාස් පොතේ මුල් පිටුවේ පිටපතක්.
   - ජංගම ගිණුමක් නම් - ආසන්නතම මාසයේ ගිණුම් ප්‍රකාශනයේ පිටපතක්
5. ස්ථාවර තැන්පතුවක් සම්බන්ධයෙන් වන විට තැන්පතුවේ වටිනාකම ලෙස තැන්පතුව අවසාන වරට අලුත් කිරීමෙන් පසු අදාළ වන අගය සඳහන් කළ යුතු අතර අලුත් කිරීමක් සිදු වී නැති නම් ස්ථාවර තැන්පතු සහතිකයේ මුහුණත් වටිනාකම සඳහන් කරන්න.
6. හිමිකම් කියනු ලබන මුදල නියමිත ලේඛනමය සාක්ෂි මගින් තහවුරු විය යුතු ය. එබැවින් හිමිකම් අයදුම්පත් සමග පහත දැක්වෙන ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

   ස්ථාවර තැන්පතු සඳහා - සියලුම ස්ථාවර තැන්පතු සහතිකවල මුල් පිටපත් සමග ආසන්නතම අලුත් කිරීමේ සහතික පත්‍ර

   ඉතුරුම් ගිණුම් සඳහා - සියලුම ඉතුරුම් පාස් පොත්වල මුල් පිටපත්

   තැන්පතු සහතික සඳහා - සියලුම තැන්පතු සහතිකවල මුල් පිටපත්
7. අදාළ තැන්පත්කරු (හවුල් ගිණුම් හිමියන් ද ඇතුළත්ව) විසින් ම හිමිකම් අයදුම්පත් ඉදිරිපත් කරන විට, අයදුම්පතෙහි, ප්‍රකාශය කොටසෙහි තැන්පත්කරුගේ හෝ නීත්‍යනුකූල හිමිකම්පාන්නාගේ නම ඇතුළත් කිරීමට සහ තැන්පත්කරුගේ නම ඇතුළත් කිරීමට වශයෙන් ඇති හිස් තැන් දෙකෙහි ම ඔහුගේ නම ඇතුළත් කළ යුතු ය.

*** විශේෂ සටහන් - නිසි පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් සහ අවශ්‍ය ලේඛන අමුණා නොමැති අයදුම්පත් සඳහා ගෙවීම් සිදු නොකරන බව කාරුණිකව සලකන්න.**